




# ලෝවැඩ සඟරාව

Non Commercial Distribution. Free For Republishing.

www.thiryak.org

වීදාගම මෛත්‍රෙය ස්වාමීන් වහන්සේ විසින් රචිත ලෝවැඩ සඟරාව සිංහල සාහිත්‍යාවලියේ දක්නට ලැබෙන අග්‍රගණ්‍ය බෞද්ධ උපදේශ කාව්‍යයකි. හයවන පැරකුම්බා රජු දවස ක්‍රි. ව. 1412 - 1467 කාල වකවානුවේදී ලෝවැඩ සඟරාව රචනා කර තිබේ.බෞද්ධ සමාජයේදී පොදු ජනයා අතර යහපත් ගුණ ධර්ම වඩවාලීම අරබයා ලෝවැඩ සඟරාව උන් වහන්සෙ රචනා කර තිබේ. "පාලි ධර්මය නොදන්නා සාමාන්‍ය ගැමි ජනතාවට පින් සහ පව් වල විපාක මෙ සේ ය යි අවබෝධ කරලීම මූලික අරමුණු කරගෙන පද්‍ය 139 කින් යුත් ලෝවැඩ සඟරාව රචනා කළෙමි " යන්න "වෙසෙසින් පෙළදම් නොමදත් දනහටපවසම් කළ කම් පල දැන්හෙළකොට "යනුවෙන් හා නො දැනෙනුවන්හට පව්පින් නියම කොටබඳ ලෝවැඩ සඟරා පිණෙනි හැම විට දක්වා තිබීමෙන් මනාව පැහැදිලි වේ. බුද්ධ වර්ෂ 2015 දී පමණ රචනා කරන ලද ලෝවැඩ සඟරාව කියවීමෙන් මෙලොව පරලොව දෙලොව ම සෙත සලසා ගත හැකි උපදෙස් අපට ලබා ගත හැකි ය. මිනිසා ගේ දෙලෝ අභිවෘද්ධියට ම හේතු වන මහා අනර්ග ධර්ම අවවාද රාශියක් කැටිකොට ගොතන ලද කවි 139 ට උචිත ලෙස ලෝවැඩ සඟරාව නමින් මේ කෘතිය නම් කොට තිබේ.

# ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රීය ස්ථවිර පාදයන් වහන්සේ

1. සෙත්සිරි දෙනමහ ගුණ මුහු     දානන්
සත්හට වන බව දුකට වෙ     දානන්
තිත් ගානඳුර දුරුලන දිනි     දානන්
සිත් සතොසින් නමදිම් මුණි     දානන්

2. ඇම පමණින් පැවසු මුනි දැන     තතු
මෙම හැම දෙන බලවයි දැක්විය     යුතු
තම තම නැණ පමණින් දැන ගත     යුතු
මම නමදිම් සදහම් පහදා     සිතු

3. සිරිමත් බඹ සිරසෙහි පා     පිසිනා
සැරියුත් මුහ මුගලන්     පිළිවෙළිනා
පිළිවෙත් සරු මහ සඟගණ     සොබනා
මුදුනත් දී නමදිම් බැති     පෙමිනා

4. මනරම් නරදම් සැරිදම්     සඟනට
මෙලෙසින් බැතියෙන් අදරින්     නමකොට
වෙසෙසින් පෙළදම් නොමදත්     දනහට
පවසම් කල කම් පල දැන්     හෙළුකොට

5. දහමට සරිකොට එළුවෙන්     පෙර කී
කවියට සිත පහදා සිට     නිස කී
සිහිකොට කද පිළිවෙළ දොස්     නොයෙකී
නිවනට සපැමිණී සඟ සැට     නමකී

6. එබැවින් එළුවෙක් කීවයි     අනදර
නොවමින් බැතියෙන් අදරින්     නමකර
සතොසින් ඇසුවොත් මෙදහම්     මනහර
සැබවින් සිදුවෙයි සගමොක්     සිරිසර

7. බිම ඉද සිට කී බණ     නාසන්නේ
විම තිව උඩ ඉඳ සිට     නාසන්නේ
කැමතිව කීවොත් විම     සාසන්නේ
එම වද සඟමොක් සැප     සාදන්නේ

8. සියල් සසර දුක් දුරුකර     නොයෙකි
අසල් කරන මොක් සිරිසැප     නිසකි
සියල් සතුනි පිං කරවයි     මුනිකී
නොකල් අටකි පින්කම් කළ     නොහැකි

9. සිතුවම් බිය කරවන     අරතරයේ
වැටුණොත් එක්සිය සතිසක්     නිරයේ
බලවත් දුක් විඳිනෙය     කරදරයේ
මඳකුත් පිනකට නැත     අවසරයේ

10. තිරිසන් ජාතියැ උපනත් පව්     කොට
අවසන් නොව බිය පවතියි පිට     පිට
මද සන්සුන් කමකුත් නැත හැම     විට
සලසන්නේ කෙලෙස ද සිත පින     කට

11. උපනත් ප්‍රේතව පව්කොට නොපණත්
කලෙකත් නොලැබෙයි සෙම්සොටු පමණක්
උගුරත් නොතෙමෙයි සුඟග වැටුත්
කලෙකත් පින් නොකළැති මැයි සිතුණත්

12. පව් මිස පිනකැයි නොකරන හැම කල
මුනිබණ නොපැවති නා පිටසක් වල
නිසි ලෙස උපනත් ලැබ දන මන කල
කිසි කලෙකත් කුසලක් නොකළැකි බල

13. දද මිනිසුන් බස් ගෙන කිසි කලෙකය
තද අකුසල් කොට කුසලින් වැළකය
අඳ ගොලු බිහිරිව ලදුවත් මේකය
මඳ පිනකුත් නොපිරෙයි බල නිසකය

14. සිත මිස කය නැති බඹ ලොව සතරකි
සිත නැතිවම කය ඇති බඹ තලයකි
මෙද සත පින් කොට උපදින පෙදෙසකි
එහි උපනත් කුසලක් නොම කල හැකි

15. බළකොටුවන් තර මෙසසර නුවරේ
මුලැසටුවන් දළුලන පව් පඳුරේ
විෂ කටුවන් සගමොක් මඟ අතුරේ
මිසදිටුවන් අයටත් පින් නොපිරේ

16. බුදු කෙනෙකුන් මේ ලොව නූපන්වර
අඳු රෙක්මය සදහම් නැති මෙසසර
ඉඳු රා නොදැනෙහි පව් පින් තොරතුර
සිදු නොකළැකි ඉන් සගමොක් සිරිසර

17. සැබවින් බණ ඇසුවත් මුනිඳුන්කී
ගොළුවන් බිහිරන් සේ නොව සැලකී
ඉදිනෙන් මිස තොප කුසලින් වැලකී
මෙලෙසින් පින් නොකළකි කල් අටකී

18. දිගු පුලුලින් සක්වල වන් සිදු කස
සිය වසකින් උඩ එන කැස් බෑ හිස
විය සිදුරෙන් නැගෙතත් දුගතිය බැස
තව උපදින්නට බැරි මෙමිනිස් කුස

19. කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ
දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ
මෙදෙකිනි මෙසසර දුක් දුර ලන්නේ
සුදනෙනි කිම වීරිය නොකරන්නේ

20. පස්පව් කොට මෙතැනත් ලැබ සෝකය
ගොස් නිරයේ දුක් විඳිනා අනේකය
රැස්කොට ඉන් පින් මේ මිනිස් ලෝකය
සිස් නොකරව් කලකින් ලත් මේකය

21. කන්නන් මෙය විස අඹපල රිස්සේ
මන් සන්තොස් කර කිම පල සෙස්සේ
දැන් දැන් එයි මරුවා පසු පස්සේ
ඉන් පින් මය කටයුතු නම් දස්සේ

22. ඉස ගිනි ගත්තෙකු එගිනි නිවන	ලෙස
කුසලට මදකුත් පමා නොවනු	මිස
මෙසසර අත්හැර නොයන මෙදුක්	රැස
වෙසෙසින් නැත අත්හරිනා	උපදෙස

23. තනකින් ගෙන දැමුවොත් කැට නුබ	කුස
අතරක නොරඳන මෙන් මේ බිම	මිස
සිත සතොසින් පින් නොකළොත් නිසි	ලෙස
නැත වටිනා තැන් සසර අපා	මිස

24. තිරව නොසිත කුණුකය	මෙතමායේ
නොතිර බවට විදුලිය	උපමායේ
නිතර මෙකය පවකට	නොනමායේ
කවර කුසල් වීරිය	නොපමායේ

25. අඳුරෙහි අස්ලොම විදිනට	දුරදී
විදුලිය පැහැ වැර දුනහොත්	වරදී
විදුලිය වන් මේ කය ලත්	තැනදී
සිදු නොකළොත් මතු සගමොක්	වරදී

26. කොතන වුණත් නැත මරු හට	බාදා
විඳින මෙසැප පින් ඇති තෙක්	වේදා
ගෙවන සසර දුක් බුදු බණ	නාදා
කුමන නැටුම් කෙළි කවට සි	නාදා

27. සැදැහැත් තන්හට බව දුක්	නොකැමැති
යහපත් කල් මේ කල් මිස වෙන	නැති
දනිතොත් දන්සිල් ගුණ සත	නොනැවතී
පැයකුත් අවුරුදු දහසක් විත	රැති

28. අද අද එයි මරු පින් කර	ගන්නේ
කෙලෙසද සෙට මරු නේති	සිතන්නේ
කිකලද මහ සෙන් මරු ඇප	වන්නේ
කුමටද කුසලට කම්මැළි	වන්නේ

29. කුමටද කා බී නිති සැර	සෙන්නේ
කොතැනද මේ කය අරගෙන	යන්නේ
ඇම සඳ නොමැළිව පින් කර	ගන්නේ
එම වද සගමොක් සැප	සාදන්නේ

30. තෙරව සසර සයුරෙන් තෙපි	නොලසා
තිරව ලබන මොක්සිරි සැප	උදෙසා
තොරව පවින් නිතරම මුනි	බණසා
කරව කුසල් වීරිය පසු	නොබැසා

31. හැමවිට පිනටම සිත	පාදන්නේ
නිවනට මග එම වද	සාදන්නේ
වැඩකට කී බස් කිම	නාදන්නේ
නිරයට වන් කලදෝ තොප	දන්නේ

32. මොක්සිරි දෙන මුනිඳුන්ගේ	උපතකි
කප් කොළ සිය දහසකිනුත්	නොලදැකි
පත් වූ එබුදුන්ගේ යුත්	මෙකලකි
එක් වරදුණ නැත පරලොව	පිහිටකි

33. අත්වැඩ පරවැඩ සමව සිතන්නේ
මෙත්සිත සව්සත කෙරෙහි කරන්නේ
ඒත් බැරි නම් තොප සසර ගෙවන්නේ
සෙත් පුර සැප කෙලෙසකද ලබන්නේ

34. මස් ලේ නැති ඇට බලු ලෙව කන්නේ
කුස පිරුමක් පලයක් නොල බන්නේ
ලෙස් ඒ සැපතෙහි සැප නොසිතන්නේ
දොස් නොපෙනෙනු මිස දුක්මය වන්නේ

35. මස් කැටියක් ගත් උකුසෙකු අහසේ
මස් නොදැමුව උකුසන්ගෙන් වැනසේ
පස් කම් රස ලොබ කළහොත් එමසේ
පස් විසි මහ බයකින් දුක් සැලසේ

36. සෙත සලසන මුනිබණ ඇත ස්මිහිරි
ඇත තොපගේ කන් ඇසුමට නොබිහිරි
නැත කරනට පිනකුත් මෙතොපට බැරි
සතර අපා දුක් වද විඳිනට බැරි

37. කරන කලට පව් මීරිය මීසේ
විඳින කලට දුක් දැඩිවෙයි ගිනිසේ
ඇඳින එපව් දුරලන උප දේසේ
නුදුන මැනවි තුන්දොර අව කාසේ

38. අදමින් ජීවත් වෙනවා විතරට
දැහැමින් මිය යනු සොඳමයි දනහට
මෙලෙසින් වදහල මුනිබණ සිහිකොට
සැබැවින් පින්කොට පැමිණෙව් නිවනට

39. එකම සතකු තම මව් මළ දුකටා
වෙනම ඇඩූ කඳුලේ බිඳු වලටා
මෙහැම මුහුදු දිය අඩුවන කලටා
තවම සසර ආලය ඇයි තොපටා

40. ළිප ගිනි මොළවන තෙක් දිය සැළියේ
සැපයක් යයි කකුළුව දිය කෙළියේ
එපවත් තොප සිතතොත් නොහැ කිළියේ
සැපයක් නම් නැත මේ රස කෙළියේ

41. උඩු සුළඟට අල්වා ගෙන යන්නේ
තණසුළ නොදැමී නම් අත දන්නේ
වර පල යයි කම් රස තොප ලන්නේ
එද කල කම් නිරයේ සැප වන්නේ

42. පිරුළෙන් අරගත් අබරණ මගුලට
දමමින් ගැතිවන අයමෙන් අනුනට
පෙර පින් ඇති තෙක් විදිනා සැපතට
තෙපි දැන් උඩගුව නොවදිව් නිරයට

43. වදයට බැඳගෙන ගෙනයන සොරුටා
වද මල් දම්ලූ බෙර පිරි වරටා
ලද ඉසුරෙහි ලොබ කල හොත් තොපටා
එද සැපතෙහි කළකම් මරු රවටා

44. දුමුවොත් ගිරි මුදුනෙන් හෙන සොරුටා
පවනින් කම් නැති මෙන් ඇඟ ගිමටා
ජරයෙන් මැඩෙමින් යන මරු මුවටා
සැපතින් පලකිම පව් කළ තොපටා

45. අලවන මේ කම් රස දොස විමසා
පලයව් තපසට පුලුවන් වයසා
පල රස විඳ ගස උඩ උන් මිනිසා
මුල සිඳිනා තෙක් ඉදිදෝ නොබැසා

46. බණ නම් නිබොරුය මුනිවරයන්නේ
කය නම් නොතිරය අදහා ගන්නේ
පණ නම් තණ අග පිනිබිඳු වැන්නේ
පින නම් නොපමාවම කර ගන්නේ

47. අසන් මෙමා කී දේ වැඩ ඇති වන
පසන් සිතින් උන්නත් පව් කර මින
උපන් නොතින් මතුයක් බූ පිසසුන
පයින් ඇවිද පිනකුත් බැරි එපවින

48. ලොබේ සිතින් පව් කම් කළ සතටා
ඉබේ ඉන්ට නොමදී සිතු රඟටා
හබේ කියති ගෙන ගොස් යම රජුටා
ලැබේ නිරාදුක් පැමිණෝ එවිටා

49. තොසින් නොයෙක් සැප විද සමහරු නිති
ඇසින් ම දැක පව් පින් කළවුන් ගති
බසින් කීවත් අදහා පින් නොක රති
ගොසින් නිරේ වැටුණොත් දුක් නිම් නැති

50. පින් පව් නොදැනම අනුවණ කම් කොට
කන් නන් මස් රස හොඳමයි කර තුට
ඉන් ගැලවෙනු බැරි නොගොසින් නිර යට
දැන් එම ආලය අරිනේ අද සිට

51. කාලා රස මුසු භොජන කර පෙම්
ගාලා සුවදැති සඳුනුත් මනරම්
ලාලා අබරණ රිසි ලෙස සැර සුම්
පාලා ගිය වැනි බහු රූ කෝ ලම්

52. මෙබස් තම නුවණින්ම විමසා නොතිරවූ කය ගති අසන්නේ
දෙතිස් කුණුයෙන් යුතුව මඳකුත් සාරනු බව නැණින් දන්නේ
මිනිස් බව ලත්තැනේ කුසලක් නොකර උන්නොත් අපල වන්නේ
සතිස් එක්සිය නිරේ වැටුණොත් එදයි අනුවන කම් දැනෙන්නේ

53. පෙරත් ජාතිය පතාගත් දැන් හේතු බලයෙන් මෙතැන්නේ
ලඟත් වෙන් නොව සමග දවසර උන් නමුත් සෙනෙහසින්නේ
පණත් යන කල තනිව ගෙයි උන් අයත් වෙන් වෙත් බදින්නේ
පිනුත් කල නිති කැටුව යෙයි ගිය තැනේදී සැපවිඳින්නේ

54. සාරනු කුණුකයක් ඇරගෙන කරන බහු නාටක තදේ
නෑර තම හිමි සමග දවසර උන්නමුත් සැප විද විදේ
ගෝර මරුවා පැමිණි කල් දැන යන්ට කැඳවා එන සදේ
බාරවන සුටුවන්ට බැරි වෙද පිනක් කරගත්තොත් සොදේ

55. සරණ මුනිඳුගේ අදහ පිනකුත් නොකර ඉන්නේ කුමටදෝ
මරණ පැමිණෙන කලට යමයා අවුත් කැඳවා යන්ටදෝ
කරන සොඳකම් දන් පිනක් කළ කියනු නුවනින් සොඳවදෝ
කුමන අනුවන කම් ද නෑයිනි අඬනු සිටුවා ගන්ටදෝ

56. අඩලා කම්පාව උන්නන් ඉතින් දැක්මක් නොවන්නේ
තනාලා සිත පිනක් නොකරම කුමට උපයා තබන්නේ
දමාලා යන නරක කුණු කය කුමටදෝ සැප විඳින්නේ
දිනාලා සුරපුරට යන්නට ම කී බණ අසන්නේ

57. සිටින ඇවිණ ගෙන මෙසසර බිළියේ
විඳින මෙසැප ජරයෙන් තැළී තැළියේ
දකින නැටුම් වැනි විදුලිය එළියේ
මෙදැන නොකර කුසලට කම් මැළියේ

58. දැන් පිනි බැරි දේකැයි සෙදදර බිළිවේ
අන් කළ පින් අනුමෝදන් වන්නේ
උන් කළ පින් සරි පින් ලැබ ගන්නේ
ඉන් වද සගමොක් සැප සාදන්නේ

59. සයට වේද රස මුසු බත් කන්නේ
ගඳට වේද ඇඟ සුවද කරන්නේ
ලෙඩට බේත් මේ මෙලොව සතුන්නේ
කුමට මීට සැපයෙකැයි කියන්නේ

60. මානෙන් ඉඳිතත් මේ සැප පෙරු මය
සීනෙන් ගෑ සුවඳක් සේ බොරු මය
දානෙන් සීලෙන් නොකළොත් දරු මය
පානෙන් අඳුරට ගෙනයයි කරු මය

61. දරරැස ගිනි ඇවිලුණු කල නිබදේ
ගිනි මිස දර යැයි යන බස නොයෙදේ
එම ලෙස එක්කොට වදහළ මුනිදේ
දුක මිස කය යැයි යන බස නොයෙදේ

62. ඉඳතොත් බෝ කල් ජරයෙන් විසිරී
නැතහොත් වැද යයි මරුමුව කුහරේ
මෙමහත් ජරමර දෙදෙනා අතරේ
මෙසැපත් සැපයයි ගනිදෝ කවරේ

63. අසල් ගෙයක සොරකම් ගිය දවසෙක
කුහුල් සිතින් ඉන්නේ තම ගේ රැක
සියල් සතුන් මරු ගෙන යනු දැක දැක
කුසල් නොකර ඉන්නේ ඇයි නොව සැක

64. ගඟ යන ඇත්කුණ ඉඳ මස් රසටා
සිඳු මැද වැද වැනසුණු මෙන් කපුටා
ලද ඉසුරෙහි ලොබ කලහොත් තොපටා
බව සයුරෙන් ගමනෙක් නැත ගොඩටා

65. පර සතුරන් එති එති යන බසටා
ඇර අඹු දරුවන් යන තොප වලටා
ගොර ජර මරු එනු දැක දැක වෙතටා
පර මාදව ඉන්නේ ඇයි පිනටා

| | | |
|---|---|---|
| 66. | ගග වතුරෙහි වන මිනිසකු | දුකිනේ |
| | ළග කළ ඔරුවට නොනැගෙන | ලෙසිනේ |
| | සග මොක් දෙන බණ අදහා | නොගනේ |
| | දුගතිය වැද තොප කිම දුක් | විදිනේ |
| 67. | ශිල්ප නැටුම් සේවාකම් | පාතද |
| | අල්ප දෙයක් උදෙසා විදිනේ | වද |
| | ශිල්ප හදා රැක්කෝතින් තතු | ලෙද |
| | කල්ප දහස් සුර සිරි විදිනේ | වෙද |
| 68. | උන්නත් නැඟී සිටිනට බැරි | තීරුව |
| | සිටියත් ඉදිනට බල නැති | මාරුව |
| | ජරපත් වූ කල නොතිබෙයි | මේරුව |
| | කරතොත් කරගත් දන් පින් | සීරුව |
| 69. | මුන් හැම අඹු දරුවන් | උපදින්නේ |
| | පින් බලයෙන් බෝකල් | පවතින්නේ |
| | උන් කළ පින්මය උන් | රඳවන්නේ |
| | ඉන් සිත ලොබමය තොප | පවතින්නේ |
| 70. | ශිල ගුණෝ පිහිටාගෙන | නොයිඳේ |
| | ආලය කර රකිනා තොප | නිබඳේ |
| | බාල පියඹු දරුවෝ නම් | මෙසඳේ |
| | බාල කලට කෙළිනා උතු | වළඳේ |
| 71. | දුක් ගෙන රැස් කළ දන හැර | කැමතී |
| | නික් මෙන නිරයට නරයන් | සිරිතී |
| | දුක් දෙන අඹු දරුවන් නිති | රකිතී |
| | මොක් දෙන පිරිසිදු සිල් නොම | රකිතී |
| 72. | නෙලදත් අහරක් සා දුක් දුරු | කොට |
| | නැතුවත් කඩ රෙද්දක් එක | පටකට |
| | බලවත් නිරයේ තද දුක් සිහි | කොට |
| | මදකුත් පසු නොබසිව් තොපි | පිනකට |
| 73. | නසතොත් සිත ලොබ අනුවන | දොසමය |
| | වසතොත් සැදැහැත්තන් ඇති | දෙසමය |
| | දෙසතොත් සගමොක් දෙන උප | දෙසමය |
| | අසතොත් මුනිදුන් වදහල | බසමය |
| 74. | වැනුවා නම් බුදු ගුණ | වැනුවාමය |
| | තැනුවා නම් තම සිත | තැනුවාමය |
| | දෙනුවා නම් දන් පින් | දෙනුවාමය |
| | දිනුවා නම් පරලොව | දිනුවාමය |
| 75. | අසතොත් නිවරද මුනිදු | තෙපුල්මය |
| | හරිතොත් නොතබා දස | අකුසල්මය |
| | රකිතොත් සිත පිරිසිදු කොට | සිල්මය |
| | දනිතොත් මෙසියල්ලට මේ | කල්මය |

76. මෙස සර රුක දුක් විස පල ගත් අතු
ලෙස ඇති වෙයි පව් සිය පලයෙන් යුතු
තොස වඩමින් ඉන් බැහැර නොයා සිතු
දස අකුසල් පල අසව මෙයින් මතු

77. බුදු බණ අසමින් සිත සතපායේ
කුරුපණ කම් ඇරපිය ඒපායේ
පර පණ නැසුවොත් කවර උපායේ
අපමණ දුක් දෙයි සතර අපායේ

78. මැඩියන් නයිමුව ගොදුරුව ඉදයා
පණුවන් කන මෙන් රස විද විදයා
සැලෙමින් ජර ගොර මරුමුව වැදයා
බලමුන් පර පන වනසන ලෙදයා

79. බලයෙන් වත් කිසියම් සොර සිතකින්
සියතින් වත් දැනුවූ උප දෙසකින්
පරසන් තක දෙය ගත සොරකමකින්
නිරයෙන් නිරයට පැමිණෙයි එතෙකින්

80. ලොබිනා මිහිරිව සොරකම් කළ සත
විදිනා දුක් මේ ලොව මෙතෙකැයි නැත
මෙදිනා ඒ දැක දැක ඉන් නොනැ වත
ඉඳිනා කල කීකලෙක වේදෝ සෙත

81. අසු කොට  ගත නොතබති ආදාරය
වදකොට මරුවත් නැත එච්චාරය
ලසුකොට නොසිතව් පව් පරදාරය
නිරයට ඇදගෙන යනඑම පාරය

82. අසුවාම කියන බස් අර තරයේ
මුසවා බස් කීවොත් එක මුරයේ
වසවා දෙව් ලොව යන මං තරයේ
පැසුවා මිස නාරී ගොර නිරයේ

83. පලදෙන පව් පින් දෙක නොබලා මේ
පවසන බස් උරසක් මාලාමේ
බිදුවන බස් වැඩ නැති කේලාමේ
මතුවන දුක් නොදනෙන වේලාමේ

84. ඇවිස නොබැන බස් කනට යවුල් ලෙස
සිතස තොසින් කිය කියතොත් පිය බස
පරුස තෙපල් බිණුවා නම් මහ දෝස
එවිස නොයයි  පරලොව දුක් දී සිම

85. පෙරසිට වියතුන් නොකියා වැළකී
දෙලොවට වැඩ නැති බස් අකුසලකී
කෙළියට වත් ඒ වැඩ නැති බසකී
නිරයට වැද යන රජ මාවතකී

86. අන්සතු සැපතක් දැක දළ ලොබිනේ
උන්ට නොවී මට වේවයි සිතිනේ
උන් කල ඒ සිත හටගත් පවිනේ
උන් මතු නිරයේ දුක්මයි විඳිනේ

87. රිසිනු දනහට කර කෝ දේයා
නසී වයි යන සිත වෑපා දේයා
බසිනා නිරයට ඒ පා දේයා
කිසි කලෙකත් ඒ ඒ පා දේයා

88. නිවනට මග මුනි කියම්
දහමට වෙන් වු දෙසැටක් සමයම්
සිරිකොට ගත් සිත වෙයි මිස දිටුයම්
සසර බිජුවට මයි ඒ සමයම්

89. නොයෙකී රස බිම නිඹ බිජුවට ලත
එමකී සිටිනෙය තිත්තම පල ගත
මෙමකී මිසදිටු අදහස් ඇති සත
කළකී දෙය අකුසල් මිස පින් නැත

90. හට සිල් මිසදිටු ගත් අය නියතී
අට ගත් දුක් ගිනි කඳ මැද පැසෙතී
අට මහ නර කය පැසුනත් නොනැවතී
පිට සක්වල එක් පෙදෙසක පැසෙතී

91. මේ දස අකුසලින්නෙකුත් කලහොත්
උපදෙසකින් බසකින් කර වූවොත්
එවිගස ඒ අදහස කින් සිතුවොත්
නොනැවත මොහු හැමදෙන නිරයටයෙත්

92. කරදර දස අකුසලයෙන් නොමිදී
වැරසර පෑවොත් මෙමිනිස් ලොවෙදී
මෙරගිර මුදුනින් හුනුමෙන් නොරැඳී
පරතෙර නැති දුක් සයුරේ කිමිදී

93. බුදුවත් මෙතෙකැයි නොකියැකි පිරිසිඳ
බලවත් මහ දුක් විඳුවන හැමසඳ
සිතුවත් බිය වන අටමහ නිරයද
ඔසුපත් එක්සිය සතිසෙක් වෙද

94. තෙසියක් තෙප් මුව වැද සිදුරුවගත
දවසක් මිනිසකු විඳි දුක් නොනැවත
මොහොතක් නිරයේ විඳි දුක් සමවත
අබැටක් හා සරි නොවෝදෝ හිමවත

95. පෙර අගනක් එක් එලු දෙනක හිසසිඳා
සිය ලග වැළඳී ගිනි දැල් නිරය දුක්විඳා
ඇය ඇග ලෝම ගණනේ ඉස් කැපුම්ලදා
මෙම රග වේය කාටත් අකුසලේලෙදා

96. කෙළියට කඩක් සගවා යහලුවකු ගෙනේ
එළී කොට නැවත දුන් මිනිසකුට මෙතෙකිනේ
විළි වැස්මක් නොමවිය දෙවි වුවත් අනේ
කෙළියට වත් නොකරවි සොරකමක් දැනේ

97. නැණ නැති අයෙක් පෙර පරදර බව් කැමතී
ගුගුරති ගැලෙති තිස්වා දහසින් උඩෙතී
හිම්නැති තවම ලොහොකුඹු නිරයේ පැසෙතී
නොකෙරෙති මෙපව් නුවණැති අය වැඩකැමතී

98. ළැදිව රජෙක් බොරු බස් කී විගසකයා
නැතිව රිද්දි බලයෙන් ඒ මිනිස්කයා
පොළව පළාගෙන ගොස් වැටුණි නරකයා
මෙලොව සතුනි ඉන් බොරු කීම නරකයා

99. පිසුණු කයා සග දෙනමක් වෙනස් කොට
පැසුණු එකෙක් නිරයේ කල්පයක් සිට
මුහුණු කුණුව තව ප්‍රේතව විඳි ගැහැට
පිසිණු බසක් නොකියම් අද පටන් සිට

100. පෙර මහනෙක් සඟගණහට බැණ නපුරු
නිරයේ වැටී බිම සත් ගව් වැඩෙන තුරු
ගොර දුක් විඳී තව ප්‍රේතව සිට කුරිරු
පර හට එයින් නොකියව් බස් නොපිය කරු

101. කීවොත් වැඩක් නැති බස් ගොර නිරා ගැබේ
මහත් කුරිරු දුක් විඳ යලි ආවොත් මොබේ
කීවත් සැබෑ නොගනිති ඔහුගේ බස් සබේ
ගෙවත් සසර දුක් මෙම නොකියතොත් සැබේ

102. අන්සතු දෙයක් වේවයි සිතුව තමහට
ඉන් දුගතිය දුක්විඳ අව මේ ලොවට
උන් සිතුවත් සිදු නොමවෙයි ඒ ලෙසට
මින් මතු සිතක් නොසිතව් එවැනි පවකට

103. බෝවා දහස් පැසවන නිරය වෙන වෙන
වෑපාද නම් දුරු මත බව නපුරු වන
ආබාධ දුක් විඳවන උපනූපන් තැන
වෑපාදයක් නොසිතව් දැන දැන සිතින

104. කලක් නිරා දුක් බිඳ විටෙක ගොඩ දුටු
නොයෙක් රෝග අටගෙන ගත වෙයි අරිටු
උදක් නුවණ නැතිවේ සිත වෙයි කිලිටු
මෙවක් පටක් විසමෙන් සිතනු මිස දිටු

105. බවයෙන් බවයෙහි හෙළමින් නොයෙකී
තොප දැන් විදිනා දුක් දැන නිසැකී
සසරින් ගොඩ නැගුමට මුනිඳුන්කී
ලෙස පින් පවසම් ඇසුවොත් යෙහෙකී

106. අන් හට අලසව නොකොට විදානය
පින් මිස අනිකක් නොකොට පදානය
තුන් සිත පිරිසිදු කොට දුන්දානය
උන් ගිය ගිය තැන ලැබෙයි නිදානය

107. ඇතුලට වැද ගෙය ඇවිළෙන ගින්නේ
පිටතට හළ බඩුමය වැඩ වන්නේ
මෙසිතට ගෙන ලොබ නොව දන් දෙන්නේ
තම හට චිම වද මතු පල දෙන්නේ

108. බුදිනට ගත් බත් පිඩ මිස වෙන නැත
යදිනට දන් දෙව මතු දුක් නොවි දිත
මෙම හට ඇති ඉතිරිය දෙම් යන සිත
සැම රට රජ සිරි සැප ලදුවත් නැත

109. පින් නොකරන දුදනන් බස් නාදා
තුන් දොස් මල දුරුකර සිත පාදා
පන්සිල් නිති අටසිල් රැක පෝදා
ඉන් මොක්පුර පැමිණෙව් නොව බාධා

110. ලොල් සිත මුල් සිඳ නිති තැන් සිතිනේ
සිල් පිරි සිදු කොට සදරැස් ලෙසිනේ
වල් රකිනා සෙමරක මෙන රකිනේ
කල් නොයවා ඉන් මොක් සිරි ලබනේ

111. වෙත්වා සව්සත හැමකල් නිදුකී
පත්වා සැපතට බවදුක් වැළකී
යෙත්වා සමගිව නිවනට මුනිකී
මෙත්බා වනානම් වැඩිපින් කමකී

112. යහපත නොසිතන සැටි මේ      දනයා
කිපිසත උනුනට දෙති වේ      දනයා
හැමසත වෙත කළ මෙත් බා      වනයා
සැක නැත සගමොක් සැප සා      දනයා

113. දෙන්නන් ණය දුන් රන් සේ      පොළියට
දුන් දුන් සේ තම කළ පින්      අනුනට
එන්නෙත් දියුණුව තියුණුව      තමහට
ඉන් දැන් නුකුසී වව් පින්      දීමට

114. මුනිදුන් බණ පද කරවා      පුහුණු
දෙසමින් දනහට වඩවා      කුලුණු
එපිනෙන් නොපැමිණ නිරයට      දරුණු
ලැබගත් මතු සග මොක් සිරි      දියුණු

115. දිවමන් මුනිඳුන් දුටු මෙන්      තොසවා
බණ දන් නන් හට වැඳ අත්      ඔසවා
පදයෙන් පදයට අදරින්      අසවා
එපිනෙන් නිරයට යන මං      වසවා

116. දුරුකොට හැම විට සිත ඇති      මානේ
ගරු කොට වැඳ වැඳ දුටු තෙක්      මානේ
මුනිදුට පුද කළ බත් මල්      පානේ
සත හට සග මොක් මග එම      පානේ

117. ඇත ලොව වන පස මල් හැම      දවසා
කොතනක පිදුවත් මුනිදුන්      උදෙසා
සිත මෙව් තර පිනටත්      නොමසලකා
සසරින් ගැලවෙන්නේ      කෙලෙසා

118. මුනි පුත් සඟ ගණ මව් පිය      ගුරුවර
ජර පත් කුල දෙටු ගිලනුන්      තවසර
රැක සිත් සේ කල අත් පා      මෙහෙවර
සුව පත් කර සිරි සිදුවෙයි      සුරපුර

119. ලොව ඇත්තන් නුවනින් විමසා      දැක
හිත නැත්තන් යයි නොසිතා වෙන      සක
ගුණ ඇත්තන් ගුණ කීම නොවී      සැක
නුව ණැත්තන් පින් කරන      උපාසක

120. ගොඩලමින් සත්වග බව      දුකිනේ
ගෙන නිවනේ සිටුවන තුටු      මතිනේ
තුනුරුවනේ ගුණ සිහි කළ      සිතිනේ
නැත විඳිනේ දුක් සසරෙහි      ඉතිනේ

121. පින් මිස නෑයන් වන පිහටක් නැත
අන්ගෙන් මතු හිමිවන දෙයකුත් නැත
ඉන් මතු අදහා සිහි කරතොත් සත
අන් කුසලක් නොකලොත් මෙම ඇත

122. කුරුපණ අවයෙහි ඉපදුම් නැති කොට
අපමණ සැප සපයා දෙන සත හට
බුදු බණ ලෙස පැවතුම් බැරි මෙතො පට
තිසරණ මිස පිහිටක් නැත සසරට

123. පුරවා සත් රුවනින් මුළු දෙරණය
කරවා පායක් බඹ ලොව පමණය
බඳවා රන් දද ලා මිණි තොරණය
දෙනවා ටත් වැඩි පින් බුත් සරණය

124. අසමින් මෙදහම් අලසව නොයිදේ
පුරමින් මේ සියලු පින්දම් නිබදේ
කෙලෙසුන් මුල් නොතබා සිත පසිදේ
ලැබගත් මොක්සුව මතුදුක් නොවිදේ

125. සිගපත් එකෙක් පෙර අනුරුදු තෙරුන් දැක
තමලත් බතින් දුන්නේ එකම සැන්දක
බලවත් එයින් සුරපති විය ඉන් දික
නැණවත් කරව් පින් දන් පල මෙයින් දැක

126. දවසක් පමණ සිල්රැක කුලඟනක් පෙරා
දහසක් සුරඹ පිරිවරමින් රුවින් සරා
තවසක් සුරිදු ලග විඳ නිරන් තරා
විගසක් එයින් තොර නොරකව් සිතින් දරා

127. කෙලෙසුන් කෙරෙන් තොරකර සිතු තනාමය
නිදුකින් ලැබෙයි බඹලොව සැප මනාමය
සුදසුන් නිවන් දෙයි මරසෙන් දී නාමය
පිනකින් උතුම් පින නම් බාව නාමය

128. කළ පින් දීම නම් තම සිත සතුටුකොට
බැදි රන් හිණෙකි දෙව්ලෝ යසට නැඟුමට
නැගි පුන් සඳෙකි අව බිය ගිම් නිවීමට
නිති පින් එයින් දෙව දුටු දුටු දනන් හට

129. දන් දෙන සඳෙහි දෙව්රම් වෙහෙර මුනිදුට
පින් අනුමෝදන්ව මිනිසෙක් එතැන සිට
පින් ලැබ ගතිය වැඩි කරමින් එසිටු හට
ඉන් දුන නොදුන කිම අනුමෝදනාවට

130. මින් ලබමියි නොසිතා කිසි උපකරණ
මුන් සසරින් ගොඩලම් යන කර කුළුණ
පින් පව් දෙකම නොවරදවා කීවොත් බණ
ඉන් තොප විඳින සැප මෙතෙකැයි නැත පමණ

131. බුදුන් දෙසන බණ මිහිරෙත්ම සිත තැනී
පසන්ව උන් මැඩියෙක් කැවිටකින් ඇනී
එයින් මිස තිදස ලද ඉසුරු බෙහෙ විනී
මෙවන් දහම් ඇසුමට මැළි නොවව් දැනී

132. දුක්පත් සතෙක් මුනිදුන් වෙත සිත පැහැදී
එක් දා ගැබෙක දිය බෙරලිය මලක් පිදී
සක්විති සැපත් ඉන් පනිතිස් වරෙක ලදී
දුක් නැත මෙපුද කරතොත් අකුසලින් මිදී

133. වෙස්සබු මුනිදු දැක එක වරෙක වැන්දේ
තිස් එක කපෙක දුගතිය දුක් නොවින්දේ
තොස් වඩවන සුරනර ඉසුරු වින්දේ
සෙස්ස නැතත් මෙකුසල් බැරි කුමන්දේ

134. කළහොත් සිල්වතුන් හට වතා වත
දුටු සක් කෙනෙක් වෙති ඕ හට ඉතා හිත
නැණ ඇත්තවුන් සාදන පින් වතා වත
ඉමහත් පිනක් දැන ගතිතොත් හිතා හිත

135. පින්කම් කරන අය ඒ දියුණුවන ලෙස
මන් සන් තොසින් එහි ගුණ කියන ඇති ලෙස
උන් උප නූපන් තැන පැතිරෙයි ලොව වසස
පුන් සඳ පහන් වූ මෙන් අදහව් මෙබස

136. තිසරණ ගත් එක් මිනිසෙක් එක් කළෙක
නොපැමිණ දුගතියට සිට කප් එක් තිසෙක
අපමණ සැපත් සගමොක් සිරි ලදි නිසැක
එසරණ නොගෙන තොප විඳිනේ කිම මෙදුක

137. අනුවණ කමින් සිහි නොකරනු මිස සතත
අසරණ තොපට පිළිසරණෙක්මය නියත
බුදුගුණ සිතින් එකගව සිහිකරන හොත
අපමණ සැපත් සිදුවෙයි සැක නොකර සිති

138. ලොවට උතුම් මුනි රජුගේ ගුණ විපුල
සිතට රැගෙන සිහි කළ නුවනින් නිමල
සතට නොවී කලෙකත් බව දුක් අසල
යසට එයින් සිදුවේ සිරි සුබ මගුල

139. නොදන්නවුන් හට පව් පින් නියම කොට
බඳ ලොවැඩ සඟරා පිනෙනි හැම විට
ලද සැපතින් තොර නොව ලැබ නිති පිහිට
වැද සව්සත සැනසේවා මොක් පුරයට

140. වීදාගම වෙහෙරෙහි මෙත් තෙරිදු සඳ
සාදාරණව පැවසූ මෙත් සිතින් නද
බාදා නොවී මොක් දැකුමට බැළී මෙපද
පාදා සතන් සිත පවතීවා නිබද

---------------------------- නිමි ----------------------------